මගේ අංකය: JSC/SEC/CIR – L/2024

**අධිකරණ සේවා කොමිෂන් සභා චක්‍රලේඛ ලිපි අංක: 14/2024**

**සියලුම මහේස්ත්‍රාත්වරුන් වෙත,**

<u>පුනරුත්ථාපන කාර්යාංශයේ ඉදිරි කටයුතු පිළිබඳව</u>

ශීර්ෂගත කරුණට අදාළව අධිකරණ, බන්ධනාගාර හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ අතිරේක ලේකම්, පියුමන්ති පීරිස් මහත්මිය විසින් අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම් අමතන ලද 2024.04.30 දිනැති ලිපිය (ඇමුණුම් ද සමග) පිළිබඳව සලකා බැලූ අධිකරණ සේවා කොමිෂන් සභාව, පුනරුත්ථාපනලාභීන් මධ්‍යස්ථාන වෙත ඇතුළත් කිරීම හා සැබැඳිව එම ලිපියේ සඳහන් කර ඇති පහත නිර්ණායක ඔබගේ අවධානයට ලක් කරන ලෙසට මට නියම කර ඇත.

අ. මධ්‍යස්ථාන වෙතින් එක් වරක් පුනරුත්ථාපනය වූවන් නැවත පුනරුත්ථාපනය සඳහා යොමු නොකිරීම.

ආ. අන්තරායකර මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවූවන් පමණක් පුනරුත්ථාපන ක්‍රියාවලිය සඳහා යොමු කිරීම. (බරපතල ගණයේ විවිධ අපරාධ කළ පුද්ගලයන්, මිනීමැරුම් සහ ස්ත්‍රී දූෂණ කළ පුද්ගලයන් ඇතුළත් නොකිරීම)

ඇ. පුනරුත්ථාපනයට සුදුසු බවට වෛද්‍ය නිලධාරීන්ගේ නිර්දේශය සහිත වෛද්‍ය වාර්තාවක් ලබා දීම හා මානසික ආබාධ, සමාජ රෝග, බෝවන රෝග, විවිධ ශාරීරික ආබාධ ඇති අය හා දීර්ඝ කාලීන රෝගාබාධයන්ගෙන් යුතු අයවළුන් යොමු නොකිරීම.

ඈ. වයස අවුරුදු 18-60ත් අතර පුනරුත්ථාපනලාභීන් පමණක් පුනරුත්ථාපනයට යොමු කිරීම.

02. ඒ අනුව, උක්ත නිර්ණායක අවශ්‍ය කටයුතු සඳහා අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ වෙබ් අඩවියේ පල කොට ඔබගේ අවධානයට ලක් කරමි.

අධිකරණ සේවා කොමිෂන් සභාවේ අණ පරිදි,

එච් .එස්. සෝමරත්න
ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව

එච්. සංජීව සෝමරත්න
ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව
කොළඹ 12

2024 ජූලි මස 05 වෙනි දින
කොළඹ 12
අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ දිය.